# 1972 - 1981 දශකයේ දී ප්‍රාථමික ශ්‍රේණිවල ශිෂ්‍යයන් සඳහා ප්‍රකාශිත සිංහල ළමා ප්‍රබන්ධ සාහිත්‍ය කෘතීන්හි පිළිඹිබු වන ආකල්පවල ස්වභාවය

ඩී. ඒ. ජයසේන
M. Phil - 07.

UCLIB
442625

කොළඹ විශ්ව 'විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ අධ්‍යාපන දර්ශනපති උපාධියේ අවශ්‍යතා පූරණය කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණාත්මක නිබන්ධනයකි.

පෙබරවාරි 1982.

# පර්යේෂණ සාරාංශය

ශ්‍රී ලංකාවේ ළමා සාහිත්‍යය පිළිබඳව සාතිශය උනන්දුවක් 1979 ජාත්‍යන්තර ළමා වර්ෂය පසුබිම් කරගෙන ඇති විය. එමගින් ඇති වූ ප්‍රබෝධය හා උනන්දුව මත ලියැවී ප්‍රකාශයට පත් වූ කෘති වැඩි කොටසක් ප්‍රාථමික ශ්‍රේණිවල දරුවන්ගේ අධ්‍යාපනික සංවර්ධන අරමුණු කර ගැනිණ. මෙම ප්‍රාථමික අධ්‍යාපන යුගයේ දී දරුවන්ගේ ජීවිත තුළ චර්යාමය වශයෙන් විශාලතම පෙරළියක් සිදුවන බව හා සිදුවිය යුතු බව මනෝවිද්‍යාඥයින්ගේ පිළිගැනීමයි.

තමාට මෙන් ම සමාජයට ද හිතකර හා ඵලදායී පුද්ගලයකු බිහි වීම සඳහා මග පෙන්වන ප්‍රාථමික අධ්‍යාපන යුගයේ දී යෝග්‍ය ආකල්ප ළමා සිත් තුළ වර්ධනය වීම අපේක්ෂිත අධ්‍යාපන අරමුණු ඉටු කර ගැනීමෙහි ලා බෙහෙවින් උපකාර වේ. එබඳු ආකල්ප සංවර්ධනය පිළිබඳ වැදගත්කම හා එබඳු ආකල්ප සංවර්ධනයක් ළමා කථා පොත් තුළින් ජනිත වන ආකාරය ගැන බොහෝ පර්යේෂණ සිදු විය යුතු වුව ද, ඒ සඳහා වූ පර්යේෂණ කෘති නොවිණි. එබඳු පර්යේෂණයක් ලේඛකයකුට මෙන් ම රසිකයනට ද ගුණාත්මක වර්ධනයක් සඳහා උපකාරී වනු ඇත. මෙම පර්යේෂණය එබඳු එක් ප්‍රයත්නයක් වෙයි.

1972 - 1981 දක්වා දස වසර ළමා සාහිත්‍ය කෘති රාශියක් ළමා වර්ෂය පදනම් කරගෙන බිහි වූ යුගයෙකි. එනිසා පර්යේෂණයකට සුදුසු කාල සීමාවක් ලෙස මෙය තෝරා ගැනිනි. පර්යේෂණයේ දී නියැදිය වශයෙන් තෝරා ගන්නා ලද්දේ 1972 - 1981 දශකයේ ලියැවුණු ළමා කථා පොත් වශයෙන් නම් කළ හැකි කෘතීන්ය. තෝරාගත් ළමාකථා 15 ක් සම්බන්ධයෙන් ගම්පහ ප්‍රදේශයේ පාසල් පහක ප්‍රාථමික ශ්‍රේණිවල ළමුන් සමග සාකච්ඡා කර අධ්‍යයනය කෙරිණි. මෙයට අමතර ව එම පාසල්වල ප්‍රාථමික වසරවල උගන්වන ගුරු භවතුන් සමග සාකච්ඡා මගින් හා ප්‍රශ්නාවලි මගින් ද එකතු කරගත් තොරතුරු පර්යේෂණ කාර්යයන්ට උපයෝගි කරගත හැකි විය.

මෙහිදී පර්යේෂණ කාර්යය මූලික වශයෙන් යොමු වූයේ පුද්ගල සංවර්ධන යටත් සමාජ සංවර්ධනයටත් අදාල වූ ආකල්ප සඳහා ළමා කථා පොත්වල සංන්දර්භය එනම්, එහි වස්තු බීජය, දෙබස් හා චරිත නිරූපනය වන ආකාරය කොතෙක් දුරට බලපා තිබේදැ'යි විමසීමටය.

ආකල්ප හඳුනා ගැනීමටත් ඒවායින් චර්යා රටාවන් කෙරෙහි සිදුවන බලපෑම අනුව ධනාත්මක හා ප්‍රතිෂේධාත්මක වශයෙන් වෙන්කර විග්‍රහ කර බැලීමටත් ගත් ප්‍රයත්නයකි, මෙය. මෙහි දී ආකල්ප සුවිශේෂ ලෙස වෙන්කර බැලිය හැකි පරිමාණයක් නිර්මාණය කිරීමේ ගැටළු සහිත බව නිසා වඩා ප්‍රචලිත ළමා කථා විස්තරාත්මක වශයෙන් විග්‍රහයට ලක්කර එහි හිතකර හා අහිතකර බව විමර්ශනයට ලක් කිරීමට උත්සාහ කර ඇත. එමගින් අනාවරණය කර ගත් යෝජනා රාශියක් මෙහි ඇතුලත් වෙයි.

මේ අතර පර්යේෂකයාගේ පර්යේෂණාත්මක හා නිර්මාණාත්මක ප්‍රයත්නයක් ලෙස 2 වෙනි ශ්‍රේණියේ (වයස අවුරුදු 7 - 8) දරුවන්ට සරල ළමා කථාවක් ඇසුරින් හිතකර ආකල්ප ජනිත කළ හැකි ආකාරය හඳුනා ගැනීම සඳහා ආදර්ශයක් ලෙස නිර්මාණාත්මක ළමා ප්‍රබන්ධ කථාවක් පරිශිෂ්ඨය ට එකතු කර ඇත. (පරිශිෂ්ඨ අංක 1)

විශේෂිත පර්යේෂණ නිබන්ධයක් වශයෙන් ඉහත දැක්වෙන කරුණු පිළිබඳ අධ්‍යයනයක් මෙම විස්තරාත්මක පර්යේෂණයට ඇතුලත් වෙයි.